**අධ්‍යාපන අමාත්‍යාංශය - උපකාරක ප්‍රශ්න පත්‍රය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2024/2025**

**11 ශ්‍රේණිය** බුද්ධ ධර්මය

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- එක් නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගින් ලකුණු 40 කි.

**1.** සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා,

I. කාලදේවල නම් වේ. III. සුදත්ත නම් වේ.
II. සබ්බ මිත්‍ර නම් වේ. IV. කෝණ්ඩඤ්ඤ නම් වේ.

**2.** සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ නිසා, රහසින්වත් පව් නොකළ නිසා ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු වන නිසා ද බුදුරජාණන් වහන්සේ,

I. බුද්ධ නම් වන සේක. III. භගවා නම් වන සේක.
II. අරහං නම් වන සේක. IV. සුගත නම් වන සේක.

**3.** සමථ භාවනාවෙන් ලැබෙන ආනිසංසයක් නොවන්නේ,

1. වහා අවබෝධ කර ගැනීමේ ශක්තිය දියුණු වීමයි. 11. මතක ශක්තිය දියුණු වීම.
111. යමක් ඉදිරිපත් කිරීමට හැකි වීම iv. ත්‍රිලක්ෂණයට අනුව ලෝකය දෙස බැලීම.

**4.** "සඤ්ඤතස්සව" යනුවෙන් අදහස් කරන්නේ,

I. පිරිසිදුකමයි. III. අප්‍රමාදී වීම.
II. නුවණ පිරික්සීමයි. IV. දමනය වීමයි.

**5.** දුටුගැමුණු මහරජතුමා විසින් ඉදිකරනු ලැබූ වෙහෙර විහාර පමණක් දැක්වෙන වරණය කුමක්ද?

I. ලෝවාමහාපාය,රුවන්වැලිසෑය, අභයගිරිය III. රුවන්වැලිසෑය,මිරිසවැටිය, ජේතවනය
II. රුවන්වැලිසෑය,ථූපාරාමය,මිරිසවැටිය IV. මිරිසවැටිය,රුවන්වැලිසෑය,ලෝවාමහාපාය

**6.** " මම තරුණවියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත." ආදී වශයෙන් පසු තැවීමට සිදුවන බව සඳහන් ධම්මපද ගාථාවේ මුල් පද දෙක වන්නේ,

I. "අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං" යන්නයි. III. "අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසිමෙ" යන්නයි.
II. "තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති" යන්නයි. IV. "සුජීවං අහිරිකේන - කාකසූරෙන ධංසිනා" යන්නයි.

**7.** සිඟාලෝවාද සූත්‍රයට අනුව උඩ දිසාවෙන් දක්වා ඇත්තේ.....

I. දෙමාපියන් ය. III. ගුරුවරුන් ය.
II. හිත මිතුරන් ය. IV. පැවිදි උතුමන් ය.

**8.** සිගාලෝවාද සූත්‍රය අනුව ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළයුතු යුතුකම් අතරට ඇතුළත් නොවන්නේ,

I. මැනවින් ඉගැන්වීමයි. III. තම මිත්‍රයන්ට හඳුන්වා දීමයි.
II. මැනවින් හික්මවීමයි. IV. පවින් වැළැක්වීමයි.

**9.** "වෛර කරන්නන් අතර වෛර නොකිරීමෙන් අපි සුවසේ වාසය කරමු" . මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පදය කුමක් ද?

I. "න හි වේරේන වේරානි III. "තංච කම්මං කතං සාධු
II. "සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ" IV. "අත්තනාව කතං පාපං -

10. යහපත් කාලයක උපත ලැබීම නිසා යහපත් ජීවිතයක් ගත කිරීමට අවස්ථාවක් උදාවීම,

I. කාල සම්පත්තියයි .
II. ප්‍රයෝග සම්පත්තියයි.
III. ගති සම්පත්තියයි.
IV. උපධි සම්පත්තියයි.

11. තිදොරින් සිදු කරන දස අකුසල කමර් අතර මනෝ කම්ම ගණයට අයත් නොවන කරුණක් වන්නේ,

I. අභිධ්‍යාව
II. අදත්තාදානය
III. ව්‍යාපාදය
IV. මිත්‍යාදෘෂ්ටිය

12. බුදු දහමෙහි වේදනා ස්කන්ධය උපමා කර ඇත්තේ....

I. කෙසෙල් කඳකට ය.
II. දිය බුබුළකට ය.
III. මිරිඟුවකට ය.
IV. මායාවකට ය.

13. "භව පච්චයා ජාති “යන්නෙන් පැහැදිලි කරන්නේ,

I. භවය නිසා නිමක් නැති දුක් අත් විඳීමයි.
II. ඉපදීම නිසා ජරා මරණාදියට පත්වීමයි.
III. සත්ත්වයා නැවත සසරට එකතුවීම නිසා සසර ඉපදීමයි.
IV. තණ්හාව නිසා නැවත භවයක ඉපදීමයි.

14 “නැවත සසරට එකතු නොවීම නිසා උපතක් සිදු නොවේ” යන්න සඳහන් වන පටිලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,

1.භව නිරෝධා ජාති නිරෝධෝ යන්නයි.
11.උපාදාන නිරෝධා භව නිරෝධෝ යන්නයි.
111.තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ යන්නයි.
1v.වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ යන්නයි.

15. විභව තණ්හාව යනුවෙන් හැඳින්වෙන්නේ,

I. පරලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාවයි.
II. පරලොවක් නැතැයි විශ්වාස කර මෙලොව සැප විඳීමට ඇති ආශාවයි.
III. මෙලොව - පරලොව දෙකම පිළිගැනීමයි.
IV. දිගටම සසර සැපත විඳීමට ඇති ආශාවයි.

16. අකුසලය ද අකුසල මූලය ද, කුසලය ද කුසල මූලය ද, අකුසලය ද අකුසල විපාකය ද කුසලය ද කුසල විපාකය ද දැන දැක ගැනීම,

I. සම්මා කම්මන්ත නම් වේ.
II. සම්මා ආජීව නම් වේ.
III. සම්මා වායාම නම් වේ.
IV. සම්මා දිට්ඨි නම් වේ.

17. බුදුරජාණන් වහන්සේට වේරංජාවේ දී යව නැමැති කටුක ආහාරය වළඳමින් කල් ගෙවීමට සිදුවූයේ,

I. පසළොස්වන වස් කාලයේ දී ය.
II. දහවන වස් කාලයේ දී ය.
III. විසිඑක්වන වස් කාලයේදී ය.
IV. දොළොස්වන වස් කාලයේ දී ය.

18. බුදු රජාණන් වහන්සේ අම්බට්ඨ සූත්‍රය දේශනා කළේ,

I. ඉච්ඡානංගල වනයෙහිදී දීය.
II. විශාල මහනුවර වනපියසක දී ය.
III. අචිරවතී නදී තීරයේ අඹ වනයේ දී
IV. කලන්දක නිවාප නම් වූ ස්ථානයේ දීය.

19. 'සත්හට වන බව දුකට වෙදාණන්' යන ලෝවැඩ සඟරා කවි පදයට අනුව බුදුරජාණන් වහන්සේ,

1.සත්වයාගේ කායික ලෙඩ දුක්වලට උතුම් වෛද්‍යවරයාය.
11.උසස් ශල්‍ය වෛද්‍යවරයෙකු වන සේක.
111.සසර දුකට ප්‍රතිකාර කරන උතුම් වෛද්‍යවරයාය.
1v. උසස් මෝහන වෛද්‍යවරයකුවන සේක.

20. ගිජු ලෙස ආහාර අනුභව කරන පස් දෙනෙකු ගැන සාහිත්‍යයේ සඳහන් වන අතර ඔවුන් අතුරෙන් අනුභව කළ ආහාර වමාරා නැවත ආහාර ගන්නා පුද්ගලයා,

I. අලංසාටක නම් වේ.
II. භුත්තවමිතක නම් වේ.
III. ආහාර හත්ථක නම් වේ.
IV. තත්තාවට්ටක නම් වේ.

21. දෙවන ධර්ම සංගායනාවේ මූලිකත්වය ගත් රහතන් වහන්සේ,

I. මහා කාශ්‍යප තෙරුන් ය.
II. සබ්බකාමී තෙරුන් ය.
III. මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් ය.
IV. වසුමිත්‍ර තෙරුන් ය.

22. ආමලකාකාර දාගැබක ගභර්යේ ස්වරූපය අනුව එය,

I. පත්මයක හැඩය ගනී.
II. සීනුවක හැඩය ගනී.
III. කළයක හැඩය ගනී.
IV. නෙල්ලි ගෙඩියක හැඩය ගනී

23. ලෞකික ධ්‍යාන උපදවාගත් පසු සිල් රැකීමෙන් සහ සිත පිරිසිදු කිරීමෙන් ඇතිවෙන විශේෂ ප්‍රතිලාභ නිවැරැදිව දැන ගැනීම......

I. මාගර් සම්මා දිට්ඨියයි.
II. කම්මස්සකතා සම්මා දිට්ඨියයි.
III. විදශර්නා සම්මා දිට්ඨියයි.
IV. ධ්‍යාන සම්මා දිට්ඨියයි.

24. පාලකයා කායික හා වාචසික සංවරයෙන් යුක්ත වීම දස රාජ ධමර්යන්හි හැඳින්වෙන්නේ,

I. පරිත්‍යාගය නම්ණි.
II. සීලය නමිනි.
III. තපස නමිනි.
IV. දානය නමිනි.

25. පුබ්බපේත බලිය යනු,

I. ආයතනයට සැලකීමයි.
II. දෙවියන්ට පින් දීමයි.
III. මිය ගිය අයට පින්දීමයි.
IV. ආගන්තුක සත්කාරයයි.

26. උත්සාහයෙන් හා දැතේ මහන්සියෙන් දහඩිය වගුරුවා ධමර්ානුකූලව උපයාගත් ධනයක් තමා සතුවීමෙන් සතුටු වීම,

I. අත්ථි සුඛයයි.
II. භෝග සුඛයයි.
III. අනවජ්ජ සුඛයයි.
IV. අණන සුඛයයි.

27. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා කරන ලද යුගය කුමක් ද?

I. කුරුණෑගල යුගය
II. පොළොන්නරු යුගය
III. ගම්පොළ යුගය
IV. අනුරාධපුර යුගය

28. කැලණි විහාරයේ අලුත් විහාරයේ චිත්‍ර අඳින ලද්දේ,

I. ජෝකරීට් මහතා විසිනි.
II. සෝම්බන්දු විද්‍යාපති මහතා විසිනි.
III. ඇල්බට් ධමර් සිරි මහතා විසිනි.
IV. සෝලියස් මෙන්ඩිස් මහතා විසිනි.

29. වාඩි වී සිටින විට වම් පාදය දකුණු පාදයට යටින් හා දකුණු පාදය වම් පාදයට උඩින් පිහිටන ලෙස නිමර්ාණය කරනු ලබන්නේ,

I. පද්මාසනයයි.
II. වීරාසනයයි.
III. වජ්‍රාසනයයි.
IV. භද්‍රාසනයයි.

30. කිරිබත් වෙහෙර, තොලුවිල, පන්කුළිය වැනි ස්ථානවල දැකිය හැකි ප්‍රතිමාඝර හැඳින්වෙන්නේ,

I. ගන්ධ කුටිය නම්ණි.
II. ටැම්පිට විහාර නමිනි.
III. ගෙඩිගේ නම්ණි.
IV. පාසාද නම්ණි.

31. ලාංකීය භික්ෂු ශාසනය ආරම්භය,

I. අනුරුද්ධ කුමරු පැවිදි වීමෙනි.
II. මහා අරිට්ඨ කුමරු පැවිදි වීමෙනි.
III. නන්ද කුමරු පැවිදි වීමෙනි.
IV. තිස්ස කුමරු පැවිදි වීමෙනි.

32. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස 'අපරන්ත දේශයට' ධර්ම චාරිකාවේ වැඩම කළේ,

I. මහා රක්ඛිත තෙරුන් වහන්සේ ය.
II. යෝනක ධම්මරක්ඛිත තෙරුන්වහන්සේ ය.
III. මිහිඳු මහ රහතන් වහන්සේ ය.
IV. මජ්ඣිම තෙරුන් වහන්සේ ය.

33. බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයාට දේශනා කළ පරිදි, වර්ණවත්ව උපත ලැබීම සඳහා ඉවහල් වන්නේ,

I. සත්ත්ව හිංසාව නොකිරීම ය.
II. තමා සන්තක දේ අන් අයට දීමය.
III. ප්‍රාණඝාත සිදු නොකිරීම ය.
IV. ද්වේෂයෙන් තොරව කටයුතු කිරීමය.

34. චූල්ල කම්ම විභංග සූත්‍රයේ සඳහන් පරිදි 'දුප්පඤ්ඤා' යනු,

I. නුවණින් අඩුව උපත ලැබීමයි.
II. අවලස්සනව උපත ලැබීමයි.
III. යසස් ඇතිව උපත ලැබීමයි.
IV. ලස්සන ඇතිව උපත ලැබීමයි.

35. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව ධාර්මිකව උපයා ගත් ධනය විනාශ වන ක්‍රමයන් ගෙන් රැක ගැනීම,

I. ආරක්ඛ සම්පදා නම් වෙයි.
II. උට්ඨාන සම්පදා නම් වෙයි.
III. කල්‍යාණ මිත්තතා නම් වෙයි.
IV. සමජීවිකතා නම් වෙයි.

36. සිදුහත් බෝසතාණන් වහන්සේ 'උපේක්ෂා පාරමිතාව' සම්පූර්ණ කළ ආකාරය ප්‍රකට වන ජාතක කතාව කුමක් ද?

I. මහා කපි ජාතකය.
II. උම්මග්ග ජාතකය.
III. ලෝමහංස ජාතකය.
IV. වෙස්සන්තර ජාතකය.

37. බෝසතාණන් වහන්සේ අවසාන උපත පිළිබඳ පසුබිම නුවණින් විමසා බැලීම හැඳින්වෙන්නේ......

I. පාරමිතා නමිණි.
II. අභීත සිංහ නාදය නමිණි.
III. ප්‍රථම උදානය නමිනි.
IV. පංචමහා විලෝකනය නමිනි.

38. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යනුවෙන් හැඳින්වෙන්නේ,

I. සතර සංග්‍රහ වස්තුවයි.
II. සතර අගතියයි.
III. සතර බ්‍රහ්ම විහරණයි.
IV. සතර ඍද්ධිපාදයයි.

39. බුදුරජාණන් වහන්සේ සතුව පවතින නොදැමුණු පුද්ගලයින් දමනය කිරීමේ ගුණය හැඳින්වෙන්නේ,

I. යථාවාදී තථාකාරී ගුණය නමිනි.
II. පුරිසදම්ම සාරථී ගුණය නමිණි.
III. තාදී ගුණය නමිණි.
IV. අසරණ සරණ ගුණය නමිනි.

40. ධර්ම රත්නයේ ගුණාංග අතුරෙන් එකකි,

I. ලෝකවිදූ ගුණය
II. දක්ඛිණෙය්‍ය ගුණය
III. විජ්ජාචරණ සම්පන්න ගුණය
IV. අකාලික ගුණය

*****

iruonline.com

## අධ්‍යාපන අමාත්‍යාංශය - උපකාරක ප්‍රශ්න පත්‍රය

**අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2024/2025**

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය**

## 11 කොටස

- **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

**1. කෙටි පිළිතුරු සපයන්න.**

(i) සිදුහත් කුමරුට නිබ්බුත පද ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ii) බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් ගිජුලෙස ආහාර අනුභව කරන්නන් **දෙදෙනෙක්** නම් කරන්න.

(iii) බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට පිහිට වූ අවස්ථා දෙකක් නම් කරන්න.

(iv) 'භෝග සුඛය' යන්නෙහි අර්ථය ලියන්න.

(v) ''සුකරානි අසාධූනී - අත්තනෝ අහිතානි ච

යං වේ හිතං ච සාධුං ච - තං වේ පරම දුක්කරං .......'' යන ගාථාවෙහි අදහස ලියා දක්වන්න.

(vi) බුදුගුණඅලංකාරය හා පූජාවලිය රචනා කරන ලද කතුවරුන් දෙදෙනා නම් කරන්න.

(vii) සතර අගතිය නම් කරන්න.

(viii) සුපටිපන්න සඟ ගුණයෙහි අර්ථය ලියන්න.

(ix) '' විඤ්ඤාන පච්චයා නාමරූපං'' යන්නෙහි අර්ථය ලියන්න.

(x) අනේපිඬු සිටුතුමා හා විශාඛා මහෝපාසිකාව සම්බුද්ධ ශාසනයට පූජා කරන ලද ආරාම දෙක ලියා දක්වන්න.

2. (i) ''තඤ්ච කම්මං කතං සාධු'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) ඉහත (i)හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න.

(iii) පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්ම පදයෙන් ලැබෙන ආදර්ශ ඇගයීමට ලක් කරන්න.

3. (i) තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු **දෙකක්** ලියා දක්වන්න.

(ii) තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට මූලිකත්වය ගත් රහතන් වහන්සේ, අනුග්‍රහය දැක්වූ රජතුමා, හා පැවැත්වූ ස්ථානය ලියා දක්වන්න.

(iii) ධර්මය හා විනය සුරක්ෂිත කිරීමට තෙවන ධර්ම සංගායනාවේ දී ගත් ක්‍රියා මාර්ග ශාසන චිරස්ථිතියට ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව

4. (i) දස පාරමිතාවලින් දෙකක් නම් කරන්න.

(ii) ඉහත (i)හි නම් කළ පාරමිතාවක් පැහැදිලි කරන්න.

(iii) බෝසත් සමාජයක් නිර්මාණය කිරීම සඳහා දස පාරමිතා උපයෝගී කරගත හැකි ආකාරය ඇගයීමට ලක් කරන්න.

5. (i) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පිරිදි බටහිර දිසාවට උපමා කරනු ලැබුයේ කවුරුන් ද?

(ii) බටහිර දිසාවට අයත් සමාජ කණ්ඩායම් විසින් ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියා දක්වන්න.

(iii) පවුල් සංස්ථාවේ සුරක්ෂිතාව පිණිස අන්‍යොන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

6. (i) ස්තූප ආකෘති දෙකක් ලියා දක්වන්න.

(ii) ස්තූපයක් ඇඳ, එහි කොටස් නම් කරන්න.

(iii) ශ්‍රී ලාංකික කලා ශිල්පීන්ගේ කලා කුසලතාව ඇගයීමට ලක් කරන්න.

(7) පහත මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) අනගාරික ධර්මපාල තුමා
(ii) පන්සිය පනස් ජාතක පොත
(iii) උට්ඨාන සම්පදා
(iv) කණිෂ්ක ධර්ම සංගායනාව

අධ්‍යාපන අමාත්‍යාංශය - ආගමික හා සාරධර්ම ශාඛාව



iruonline.com